# කළු වලාකුළු බබා



E.R.D. සෙනුදි මෙත්සඳි වන්සේයා

කළු වලාකුළු බබා

රචනය හා චිත්‍ර

ඊ.ආර්.ඩී.සෙනුදි මෙත්සදී චන්සේයා

2023-11-05

(කතෘ ප්‍රකාශනයකි)

**කතෘගේ වෙනත් පොත්**

1.තරුෂි බබා

2.යහපත් මිතුරා

**..පිදුම..**

ආදරණීය

මගේ අම්මිටයි තාත්තිටයි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පුවලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් අටෙම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමණාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මමහින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන් ආදිශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමුකල විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කල සැමට හෘදයාංගම ස්තූතිය මෙයින් පිරිනමමි.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-11-01

# කළු වලාකුළු බබා

වලාකුළු යාළුවෝ ගමනක් යන්න
ලෑස්ති වුණා.

පුංචි පුංචි වලාකුළු පැටවු
ලස්සනට හැඩ වුණා.

සුදු වලාකුළු නට නට ලස්සන
ගවුමක් ඇඳ ගත්තා.



සුදු වළාකුළු අක්කා යාළුවෝ
එනකල් මඟ බලාන හිටියා.

ඒ ගමන යන්න කළු වළාකුළු
බබාත් ලැස්ති වුණා.

එයා අම්මා ළඟට දිව්වා.

‘‘අම්මේ අම්මේ අර සුදු වළාකුළු
අක්කලා අද අහසේ ඈතට ඈතට
යන්න හදනවා."



‘‘අනේ අම්මේ මමත් එයාලත් එක්ක යන්නද?‟ කළු වළාකුළු බබා ඇහුවා.

‘‘හා කමක් නෑ දුවේ..”

“පරිස්සමින් ගිහින් එන්න” .

“රණ්ඩු කරගන්න එපා හොඳද?”

‘‘හොඳයි අම්මේ.. ‟

වළාකුළු බබා කිව්වා.

‘‘ආ මේ මොකද මේ.. කොහේ යන්නද මේ ලස්සනට ලෑස්තිවෙලා.. ”

‘‘මමත් ඔයාලා එක්ක ඇවිදින්න යන්නයි ආවේ.” කළු වළාකුළු බබා කිව්වා.

‘‘ආ ඔයාට කවුද කිව්වේ.”

‘‘සුද්දි මේ බලන්නකෝ..කැතම කැතයි මෙයා කළුම කළුයි.

ඔයානම් අපිත් එක්ක එන්න එපා..

4 7

බලන්න ඔයාගේ පාට..කළුම කළුයි.”



සුදු වලාකුළු අක්කා එයාගේ
නංගිට එහෙම කිව්වා.

කළු වලාකුළු බබා අඬාගෙන
ගෙදර දිව්වා.

''දුවේ ඔයා අඬන්න එපා.
ඒ අය ඔයාගේ වටිනාකම දන්නේ
නැහැ.

අපි වගේ කළු වළාකුළු තමයි වැස්ස දෙන්නේ.

අපි ලෝකයේ හැම තැනටම වැස්ස දෙනවා. සමහර අය වහිනකොට සතුටු වෙනවා.

එයාලට කෑම දෙන්නේ අපි උදව් වෙනවා."

''මිනිස්සුන්ට විතරක් නෙමෙයි සත්තුන්ට ගහකොළට අපි සමානව වැස්ස දෙනවා.

ඒ නිසා ඔයා දුක හිතන්න එපා.."

හොඳ වැඩ කරන අයට හැමෝම
හොඳ කියනවා.

කළු වළාකුළු බබා ලස්සනට
හිනාවුනා.[11]

කවුරුත් කැතයි කියලා
කළුයි කියලා,කැතයි කියලා,
කොන් කරන්න හොඳ නෑ..

එයාලා ගාවත් වටිනාකම්
තියෙනවා..

අම්මා පැහැදිලි කරා..





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත් ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයින් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සාමජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි.

පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවකට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023-11-01